








**කණහං ධමමං විපපහාය - සුකකං භාවෙථ පණඩිතො**

**ඔකා අනොකං ආගමම - විවෙකෙ යතථ දූරමං**

**"නුවණැත්තා ගිහිගෙයින් නික්ම පැවිද්දට අවුත් කලු ධර්ම දුරුකොට සුදු ධර්ම වඩා**

**චිත්ත විවේකය ඇතිකර ගන්නේය"**

(ධමම පදය - පණ්ඩිත වර්ගය )

ගරු ස්වාමීන් වහන්ස, කාරුණික පින්වත්නි,

අද නවම්පුර පසළොස්වක පොහොය දිනයයි. සැරියුත් මුගලන් දෙනමට අග්‍ර ශ්‍රාවක තනතුරු ප්‍රදානය කිරීම, ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීම, බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාරය අත්හැරීම යන කරුණු සිදුවූයේ අද වැනි නවම් පුර පසළොස්වක පොහොය දිනයකය.

මෙවන් පුරපසළොස්වක පෝය දිනයක මේ දහම් පණිවිඩයෙන් විස්තර කර දීමට බලාපොරොත්තු වන්නේ පණ්ඩිතයාගේ ලක්ෂණ හඳුනා දීමටයි. ධම්මපදයේ පණ්ඩිත වර්ගය වෙන්වී තිබෙන්නේ එම පරමාර්ථය ඉටුකරදීම සඳහා ය. සසර ජීවත්වන අයට තම තමන්ගේ දැනුම හොඳින් දියුණු කරගත් විට මේ පණ්ඩිත යන වචනය භාවිත කරති. උදාහරණයක් හැටියට ගතහොත් ප්‍රාචීන භාෂෝපකාර සමිතිය විසින් දැන උගත්කම් ඇති අයට පණ්ඩිත උපාධිය පිරිනමයි. සංගීතය වැනි විෂයන්හිද එවැනි තනතුරු දැකිය හැක. අප මේ කථා කරන්නේ සසර කෙළවර කරගැනීමට දක්ෂ පුද්ගලයා; බුදුදහමට අනුව පණ්ඩිතයෙකු බව පෙන්වා දීමටයි.




ඉහත සඳහන් ගාථා ධර්මයෙන් පැහැදිලි කරන්නේ සසර කෙටිකර ගැනීමට උදව්වන පණ්ඩිත ලක්ෂණයෝයි. පණ්ඩිතයා කලු ධර්ම නම් වූ අකුසල් දුරුකොට සුදු ධර්ම නම් වූ කුසල් ඇතිකර ගනී. ගිහි ගෙයින් නික්මී පැවිද්දට පත්වන ඔහු තම සිත කෙලෙස් වලින් නිදහස් කරගන්නේ ය. ඒ ලබන නිදහස තුළින් ඔහු තම මෙලොව සහ පරලොව සරුකර ගන්නේ ය. පැවිදි පක්ෂය සඳහා දේශනා කොට ඇති ගාථාවක් උවද මෙය ගිහි පක්ෂයටද තම ජීවිතය සරුකර ගැනීමට යොදාගත හැකිය.

කොසොල් ජනපද වාසීන්ගේ ආරාධනයකින් 500 ක් භික්ෂූන් වහන්සේලා වස් විසූහ. ජනපද වාසීන් වස් කාලය තුළ භික්ෂූන් වහන්සේලාට සිව්පසයෙන් උපස්ථාන කළහ. වස් අවසානයේදී දායක පින්වතුන්ට දන්වා එතනින් පිටත්වීමට සූදානම් වූවත් ඔවුන් ඊට අකමැති විය. එම දායකයින්ට අවශ්‍යවූයේ උන්වහන්සේලා එතනම නතර කරගෙන ඇප උපස්ථාන කිරීමටයි. නමුත් භික්ෂූන් වහන්සේලා දායක පින්වතුන්ගේ අකමැත්තෙන්ම එතැනින් වැඩම කළහ. මේ සිද්ධිය නිමිති කරගෙන බුදුන්වහන්සේ ඉහත සඳහන් ගාථාව දේශනා කළ සේක. මෙයින් පැහැදිලි විය යුත්තේ සසර ගමන කෙළවර කිරීමට සූදනම් වන පුද්ගලයා එක තැන ජීවත්වෙමින් දායක සබඳතා ගොඩ නගා ගෙන ජීවත්වීම ප්‍රමාදයට හේතුවක් බවයි. එයින්

පැවිදි පක්‍ෂයට චිත්ත විවේකයක් නොලැබේ. නූතන පැවිදි ජීවිතය ගැන සලකා බැලුවොත් පෙනෙන ප්‍රධානම කරුණනම් ගිහියන්ට වඩා අපිට කරදර වැඩි බවයි. සිතට කිසිදු විවේකයක් නැත. ගිහි ජනතාවගේ දහසකුත් එකක් ප්‍රශ්න හමුවේ ඒවා විසඳීමට දිවා රෑ වෙහෙසෙන අපිට චිත්ත විවේකයක් නැත. මේ තත්වය තේරුම් ගෙන හැකිතරම් මේ බන්ධනවලින් නිදහස්ව චිත්ත විවේකය ඇති කර ගැනීමට වෙර දැරිය යුතුයි.

රහතන් වහන්සේලා හැරුණු විට අන් සියලුම දෙනා කෙලෙස් සහිතය. ඒ නිසා අපේ චරිත හැඳින්විය හැක්කේ සුදු කලු චරිත ලෙසය. සුදු යනු කුසල් ය. කලු යනු අකුසල් ය. හොඳ නරක යනුවෙන් ද නම් කළ හැකිය. පාලි භාෂාවෙන් කුසල යනු දක්‍ෂයාය. අකුසල යනු අදක්‍ෂයායි. සසර ගමන දිගු කරගන්නා අදක්‍ෂයෙකි. සසර ගමන කෙටි කරගන්නා දක්‍ෂයෙකි. ඒ කුසලතාවය වැඩිදියුණු කරගෙන අකුසලතාව දුරකර ගන්නා ලෙස බුදුදහම උපදෙස් දෙයි.




කුසලය හා අකුසලය ගැන විස්තර කරන තැන්වල පෙළ දහමේ මෙසේ දැක්වේ. "තමාට සහ අනුන්ට අවැඩ පිණිස පවතින, දෙපක්‍ෂයටම අවැඩ පිණිස පවතින දේ අකුසල් ය."තමාට සහ අනුන්ට වැඩ පිණිස පවතින, දෙපක්‍ෂයටම වැඩ පිණිස පවතින දේ කුසල්ය. කුසලය හා අකුසලය පිළිබඳ ඉහතකී නිර්වචනයට අනුව සමාජය තුළ පවත්නා සුදු කලු දේ හඳුනාගත යුතුයි. මේ හඳුනා ගැනීම ඉතාම ඉහලින් කරනු ලබන්නේ පණ්ඩිතයායි.

ඉහත සඳහන් ගාථාවේ "ඔකා " යනුවෙන් හැඳින්වෙන්නේ ගිහි ගෙදරය. අඹු සැමියන් දූ දරුවන් වෙසෙන තැනය. එවැනි ගෙවල් නැති තැන "අනොක" නමින් හැඳින්වේ. ගිහි ගෙදරක පවත්නා කරදර වල ප්‍රමාණයක් නැත. ඊට හේතුව මමත්වය පෙරදැරි කරගෙන කටයුතු කිරීමයි. මම නැමැති පුද්ගලයා සතුටු කිරීම සඳහා විවිධ කටයුතු කරන්නට සිදුවෙයි. එවිට නොයෙක් අකටයුතු කම් හෙවත් කලු කර්ම කරන්නට සිදුවෙයි. එසේ කරන පුද්ගලයා මෙම ගාථාවට අනුව අදක්‍ෂයෙකි. ඔහු සසර දිගුකර ගනී.

බුදු දහම තුළ දස කුසලයක් හා දස අකුසලයක් ගැන සඳහන් වේ. පුද්ගලයා දස අකුසලයට පෙළඹෙන්නේ සසුන් පිළිවෙත නො හඳුනන බැවිනි. බුදුන්වහන්සේ යම් ධර්මයක් දේශනා කොට මේවා ශාසනික බ්‍රහ්ම චර්යාවට නුසුදුසු යයි දේශනා කොට ඇත්නම් ඒවා ගැන කාටවත් ප්‍රශ්න කළ නොහැක. මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේදී අරිට්ඨ නම් භික්‍ෂුවක් එවැනි ප්‍රකාශයක් කර ඇති බව සඳහන් වේ. කාමයන්ගේ ආදීනව දක්වා ඒවා

බ්‍රහ්මචර්යාවට අහිතකර යයි බුදුන්වහන්සේ කළ දේශනාව එසේ නොවේ යයි කීවේ අරිට්ඨ නම් භික්ෂුවයි. එහිදී බුදුන්වහන්සේ ඒ හිමියන් ගෙන්වා කරුණු පැහැදිලිකොට දේශනා කළේ මේ අරිට්ඨ භික්ෂුවට බුදුසසුනේ උණුසුමවත් වැදී නැති බවයි. මේ අනුව බුදුන්වහන්සේ යම් දස අකුශලයක් දේශනා කොට ඇත්නම් ඒවා කලු ධර්ම 10 කි. ඒවා එසේ නොවේ යයි කාහටත් කිව නොහැක. යම් දස කුසලයක් දේශනා කොට ඇත්නම් ඒවා සුදු ධර්ම 10 කි. ඒවා එසේ නොවේ යයි කාහටවත් කිව නොහැක. ඒ නිසා අපි කලුවලින් ඈත්ව සුදුවන්නට උත්සාහවත් විය යුතුයි.

ගිහි ගෙදර කාර්ය බහුලය. අවශ්‍යතා වැඩිය. මෙවැනි දේ ප්‍රකාශ කොට යමෙකු දස අකුසලයට බරවී ක්‍රියා කරයි නම්, ඔහුට ද බුදු සමයේ උණුසුමවත් වැදී නැති බව කිව යුතුයි. කොරතම් වැඩ තිබුනත් ඒවා බෞද්ධකමට ගැලපෙන ආකාරයෙන් පවත්වාගෙන යාමට උත්සාහවත් විය යුතුයි. ඒ නිසා කලු ධර්මවලින් මිදී සුදු ධර්මවලට යෙදී සසර ගමන කෙටි කර ගනිමු.




බුදුන්වහන්සේ දේශනා කළ ත්‍රිලක්ෂණ ධර්මය මේ ලෝකයේ කිසිවෙකුටත් බොරු කළ නොහැකි ය. නමුත් නූතනයෙහි සමහරු ත්‍රිලක්ෂණය පිළිබඳ වැරදි වැටහීම් ඇති කරගෙන තිබේ. අනිත්‍ය දේ නිත්‍යය, දුක ; සැපය, අනාත්මය ; ආත්මයයි, මෙවනි වැරදි වැටහීම් ඇති අයට කලු ධර්ම පෙනෙන්නේ සුදු ධර්ම ලෙසයි. මෙහිදී පැවසිය යුත්තේ බුදුරජාණන් වහන්සේ හා දේශනා කළ ධර්මය ගැන විශ්වාසයක් හෙවත් ශ්‍රද්ධාවක් ඇතිකරගත යුතු බවයි.

නූතනයෙහි බොහෝ දෙනා තම පටු ලෞකික අපේක්ෂාවන් සඳහා සර්ව ආගමික සංකල්පය ගොඩ නගාගෙන තිබේ. එවැනි අය සුදුත කලු ලෙසත්, කලුත සුදු ලෙසත් වැරදි ලෙස විවරණය කරනු බව පෙනේ. මෙහිදී බෞද්ධයන් වන ගිහි පැවිදි අප සියලු දෙනාම විමසිලිමත්ව ක්‍රියා කළ යුතුයි. කවුරු කොහොම කිව්වත් බුදුදහම වෙනත් ආගම් හා සම තත්වයට පත් කළ නොහැක. ඒ සඳහා හොඳම නිදසුනක් මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රයෙහි සඳහන් වේ. එම සූත්‍රයෙහි සඳහන් මෙම ප්‍රකාශය කරන්නේ මහා බ්‍රහ්මයායි.

"පෙර මගධ දේශයෙහි කෙලෙස්මළ සහිත ශාස්තෲන් විසින් සිතන ලද අසුද්ධ ධර්මයෝ පහළ විය. මේ ප්‍රජාවට නිවන් දොර විවෘත කරනු මැනවි. මළ රහිත ධර්මය අසා අවබෝධ කරගනු මැනවි."

පාතුරහෙසු මගධෙසු පුබෙබ - ධමමා අසුදෙධා සමලෙහි චිනතිතො

අවාපුරෙතං අමතසස දවාරං - සුණනතු ධමමං විමලෙනානු බුදධං.. "

(අරියපරියේසන සූත්‍රය)

මහා බ්‍රහ්මයා කියන පරිදි මෙතෙක් මගධ දේශයෙහි උපන් ශාස්තෲවරු කෙලෙස් මළ සහිතය. ඒ කෙලෙස් සහිත අය හිතන ලද ධර්මයෝ ද, අසුද්ධ ධර්මයෝයි. නමුත් බුදුරජාණන් වහන්සේ කෙලෙස මළ රහිතය. ඒ බුදුන්වහන්සේ අවබෝධ කරගත් ධර්මයද කෙලෙස් මළ රහිතය. [illegible] අපි මේ බව තේරුම් ගත යුතුයි. ලෞකික පටු අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම සඳහා යොදාගෙන තිබෙන මෙම සර්ව ආගමික සංකල්පය නැමැති මායාවට හසු නොවිය යුතුයි. අපේ බුදුදහමේ පවතිනා පිරිසිදු අනන්‍යතාවය තේරුම් ගෙන ක්‍රියා කළ යුතුයි. එවිට අපිට බුදුන්වහන්සේ ගැනත් දේශනා කළ ධර්මය ගැනත් ආකාරවතී ශ්‍රද්ධාවක් ඇතිවේ. එවිට බුදුන්වහන්සේ දේශනා කළ කලු ධර්මත කලු ලෙසත්, සුදු ධර්ම ; සුදු ලෙසත් දැකිය හැක. සසර කෙළවර කොට නිවන් ලැබිය හැක්කේ එමගිනි.




නමුත් වර්තමාන සමාජයේ බොහෝ දෙනා මුදලට, දේපලවලට, පිරිස් බලයට ඇති ආශාව නිසා බුදු දහමේ කලු ලෙස දක්වා ඇති දේ සුදු ලෙස දකින්නට උත්සාහ ගෙන තිබේ. එවැනි ගිහි පැවිදි හැම දෙනාටම සත්‍යය අවබෝධ කර ගැනීමට උපමා කථාවක් දක්වමි.

පෙර එක්තරා රජ කෙනෙක් ස්වාමි දියණියක් සරණ පාවා ගත්හ. රජතුමා ඇයට සියයට සීයක්ම ආදරයෙන් ක්‍රියා කළහ. ටික කලකින් තවත් බිසවක් සරණකර ගත්හ. රජතුමා ඇයට සියයට පණහක් ආදරය දැක්වූහ. ටික කලකින් තවත් බිරිඳක් සරණ කරගත්හ. රජතුමා ඇයට සියයට 25 ක් ආදරය දැක්වූහ. ටික කලකින් රජතුමා තවත් බිරිඳක් සරණ කරගත්හ. රජතුමා ඇයට කිසිදු ආදරයක් නොදැක්වූ හ. මෙසේ කල්ගතවන විට රජතුමා වයසට ගොස් දුර්වල විය. දැන් මරණයට ආසන්නය. රජතුමා මුලින්ම ගෙනා

බිරිඳ වෙත ගොස් තමා මරණයට පත්වන්නට සූදානම් බැවින් මා සමග ඒ ගමනට එනවාදැයි ඇසීය. ඇසුවිටම බැහැ යයි කියා ප්‍රතික්ෂේප කළාය. සියයට පනහක් ආදරය කළ දෙවන බිරිඳ වෙත ගොස් මේ කාරණය කී පසු ඇය කීවේ දොරකඩ ලඟට පමණක් පැමිණිය හැකි බවයි. තුන්වන භාර්යාව ලඟට ගොස් මේ කාරණය කී පසු ඇය කීවේ සොහොන ලඟට පමණක් පැමිණිය හැකි බවයි. හතරවන බිරිඳට කිසිදු ආදරයක් සොයා බැලීමක් නොකළ නිසා එතනට යෑමෙන් වැඩක් නැතැයි සිතුවත් රජතුමා ඇය ලඟට ගොස් මේ ප්‍රශ්නය ඇසීය. ඇය කීවේ ඔබ යන ඕනෑම තැනකට සෙවනැල්ල සේ මා එන බවයි. රජතුමාට මහත් අස්වැසිල්ලක් ඇතිවිය.

මේ උපමාවට අනුව පළමුවන බිරිඳ මුදල් ය. අප මිය යන විට මුලින්ම අපෙන් ඈත්වන්නේ මුදල්ය. දෙවන බිරිඳ ගේ දොරය. දෙවනුවට අපෙන් ඈත්වන්නේ ගෙවල් දොරවල් ය. තුන්වන බිරිඳ අපේ ඥාතීන් ය. ඒ අය අප සමග සොහොන් බිම දක්වා ගමන් කරති. අප අත් නොහැර සෙවනැල්ලක් සේ ගමන් කරන අපේ හතරවන බිරිඳ යනු අප ජීවිතයේ කරගත් සුදු සහ කලු කර්මයෝයි. රජතුමා හතරවන බිරිඳ ගැන කිසිදු සැලකිල්ලක් නොදැක්වූහ. අප ගැන සලකා බැලවත් අපත් එසේම නොවේ ද? තමන් සිතන සෙවනැල්ල මෙන් ගමන කරන කර්ම ගැන කිසිදු හැඟීමක් නැත. එසේ ක්‍රියා කරන අය සුදු කර්ම වලින් ඈත්වී කලු කර්ම කරගෙන සසර දිගු කර ගනී.




පසුගිය කාලය තුළ බොහෝ දෙනා ලෝක විනාශයක් ගැන කතා කළහ. මේ භෞතික ලෝකය කවදා හෝ විනාශ විය හැක. නමුත් මේ යුගයේ විනාශ වී ඇත්තේ ආධ්‍යාත්මික ලෝකයයි. නූතනයේ බොහෝ දෙනා තමා මුලින්ම අතහැර යන මුදල් නැමැති බිරිඳ සමග අප්‍රමාණ සෙනෙහසින් ක්‍රියා කරයි. ඇය සතුටු කරන්නට බුදුන්වහන්සේ දේශනා කළ කලු ධර්ම; සුදු ලෙස සිතමින් ක්‍රියා කරයි. පංචසීල ප්‍රතිපත්තිය නම් වූ සුදු ධර්ම අද බොහෝ දෙනෙකු දකින්නේ තමාට කරදර කරන කලු ධර්ම ලෙසටයි. එම පංචසීලය කඩ කළ තරමට මුදල් ඉපයිය හැක. ඒ නිසා ප්‍රාණඝාතය, අදත්තාදානය, කාම මිත්‍යාචාරය, මුසාවාදය, සුරමේරය වැනි කලු ධර්ම බොහෝ දෙනාට පෙනෙන්නේ සුදු ධර්ම ලෙසටයි. ඒ නිසා එම ධර්මය දේශනා කළ ශාස්තෘවරයාටද චෝදනා කරමින් කලු කර්මවල යෙදී මුදල් උපයාගනී. නමුත් ඒ කිසිදු මුදලක් තමා සමග නොඑන බව මතක තබාගත යුතුයි.

මෙ ගාථාවෙහි විවේක යන වචනයක් යෙදී තිබේ. මේ සඳහන් කරන්නේ චිත්තවිවේකය ගැනයි. කලු කර්මකරන තරමට සිතට විවේකයක් නැත. සමහරු පුද්ගලිකව, රහසිගතව, නිලීනව අප්‍රකටව කලු කර්ම කරති. ලෝකයේ කව්රු නොදැන ගත්තත් ඒවා

තම මනස දනී. එවිට විවේකයක් තිබේ ද? කලු කර්මවල යෙදී අද කහවනු වර්ෂාවක් ලැබුණත් එය ප්‍රමාණවත් නොවේ. ඔවුන් සිතන්නේ හෙට තවත් කලු කර්ම වල යෙදී කහවනු වර්ෂා දෙකක් ලබා ගැනීමටයි. අපේ රටේ පසුගිය කාලයේදී එවැනි ක්‍රියා කරපු අය අද බන්ධනාගාරවල දුක් විඳින හැටි දැකගත හැකිය. පුවත් පත හා වෙනත් ජන මාධ්‍ය දෙස බැලුවත් කලු ප්‍රවෘත්ති වැඩිය. බොහෝ මාධ්‍යවලට කලු පුවත් ඉතා අගනේ ය. කලු පුවත් ඇති දේ මිලදී ගැනීමට බොහෝ දෙනා කැමතියි. එයින් සිදුවන්නේ අපේ සසර දිගු වීමයි. ඒ නිසා බුදුන්වහන්සේ ගැන විශ්වාසය ඇතිකරගෙන කලු ධර්ම ඉවතලා සුදු ධර්ම වඩමින් සසර කෙටි කර ගනිමු.

